**කොවිඩ් 19 එන්නත් ප්‍රතිචාරාත්මක ප්‍රතිසාධන ව්‍යාපෘතිය - 2021**

කොවිඩ් 19 එන්නත් ප්‍රතිචාරාත්මක ප්‍රතිසාධන ව්‍යාපෘතියේ 2021 අගෝස්තු 19 සිට 2021 දෙසැම්බර් 31 දක්වා වූ පළමු ගිණුම්කරණ කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2021 ජූලි 09 දිනැතිව ඇති කර ගත් අනුපිළිවෙළින් අංක 4083 - SRI සහ අංක 4084 - SRI දරන ණය ගිවිසුමේ 4.02 වගන්තියේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම්වලට අනුව, සෞඛ්‍ය අමාත්‍යාංශය ව්‍යාපාතියේ විධායක නියෝජිතායතනය වන අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සහයෝගය/ සහභාගිත්වය ඇතිව සෞඛ්‍ය අමාත්‍යාංශය ව්‍යාපාතියේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. සාමාන්‍ය එන්නත් සේවාව සහ අනෙකුත් සෞඛ්‍ය සේවාවලට හානියක් සිදු නොවන පරිදි, COVID-19 ට එරෙහිව ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතා ජනගහනය සඳහා සුරක්ෂිතව එන්නත් ලබාදීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම්වලට අනුව, ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත වියදම රු.මිලියන 32,370 කට සමාන එජඩො මිලියන 161.85 ක් වූ අතර ඉන් රු.මිලියන 30,000 කට සමාන එජඩො මිලියන 150 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යකරණය කිරීමට එකඟ විය. ඉතිරි මුදල වන රු.මිලියන 2,370 ක් මූල්‍යකරණය කිරීමට ශ්‍රී ලංකා රජය අපේක්ෂා කරයි. ව්‍යාපෘතියේ කටයුතු 2021 අගෝස්තු 19 දින ආරම්භ කර තිබුණු අතර 2024 ජූනි 30 දින වන විට එම ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට නියමිතව තිබුණි.

## 1.3 මතය

2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා එහි වියදම් ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව අධීක්ෂණය කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

---

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| විගණනය සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව, සමාලෝචිත කාලසීමාව සඳහා අයකරනු ලැබූ බැඳීම් ගාස්තු සහ පොළිය රු. මිලියන 17 කි. කෙසේ වුවද, මෙම මුදල මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2022 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනයේ බැඳීම් ගාස්තුසහ පොළිය හෙළිදරවු කිරීමට කටයුතු කරනු ලැබේ. | බැඳීම් ගාස්තු සහ පොළිය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතිය මගින් සිදු කරන ලද ක්‍රියාකාරකම්වල ප්‍රගතිය**

ශ්‍රී ලංකා රජය සහ ආසියානු සංවර්ධන බැංකුව විසින් 2021 ජූලි 09 දින ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 30,000 කට සමාන එජඩො මිලියන 150 ක ණය ගිවිසුමකට එළඹ ඇති අතර එම ගිවිසුම 2024 ජූනි මාසයේදී අවසන් කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් සියයට 18.2 ක් එන්නත් කිරීම සම්බන්ධ පිරිවැය පියවා ගැනීම, එන්නත් ආශ්‍රිත අධීක්ෂණ පද්ධති ස්ථාපනය කිරීම සඳහා සහාය ලබා දීම, ශීතාගාර සහිත ප්‍රවාහන පහසුකම්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ අන්තර්කරණය සහතික කිරීම සඳහා වන ක්‍රියාකාරකම් සහ COVID-19 එන්නත් වැඩසටහනට අදාළ සායනික අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා මෙම ණය මුදල උපයෝජනය කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසානය වන විට ව්‍යාපෘතිය සඳහා ලබා දුන් COVID-19 එන්නත් සඳහා රු.මිලියන 3,600 කට සමාන එ.ජ.ඩො. මිලියන 18 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

**3.2 පද්ධති සහ පාලන**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව, අංක 4084 දරන ණය ගිවිසුම යටතේ 2021 වර්ෂයේදී අපේක්ෂිත මුළු විය පැහැදම් ගෙවීම එ.ජ.ඩො. මිලියන 5 කි. කෙසේ වුවද, 2021 වර්ෂයේදී කිසිදු විය පැහැදම් ගෙවීමක් සිදු නොවීය. ඒ අනුව, ව්‍යාපෘතියේ ආයෝජන සංරචකය යටතේ අපේක්ෂිත කාර්යසාධනය සාක්ෂාත් කර ගැනීමට අසමත්වී තිබුණි. | ඉහත පැහැදිලි කරන ලද පරිදි, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය 2022 වර්ෂයේදී ස්ථාපනය කළ බැවින්, විය පැහැදම් ගෙවීමේ ක්‍රියාවලිය ආරම්භ වූයේ 2022 වර්ෂයේදීය. | ව්‍යාපෘතිය සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව, නිසි අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට සහ ව්‍යාපෘතිය ඵලදායී අන්දමින් ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාකාරකම් පිළිබඳව අභ්‍යන්තර විගණනයක් සිදු කිරීම අවශ්‍ය විය. කෙසේ වුවද, මේ සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම 2022 මැයි 09 වන දින දක්වා සිදු කර නොතිබුණි. | අප විසින් ඉල්ලා සිටි විගණන නිලධාරියා සම්බන්ධයෙන් සේවක සංඛ්‍යා අනුමැතිය අප වෙත නොලැබුණි. ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වන විගණන කටයුතු සිදු කිරීම පිණිස සෞඛ්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් ඉල්ලීමක් කර ඇත. | අභ්‍යන්තර විගණනයක් පැවැත්වීම සඳහා ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |